සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සතිය - 1

විෂය - බුද්ධ ධර්මය

ශ්‍රේණිය - 5

2021 සැප්තැම්බර් මාසය

සැකසුම : ඉරේෂා නිල්මිණී මිය - බලන්ගොඩ අධ්‍යාපන කලාපය

# 13.අපි විහාර ගෙයක් නැරඹුවෙමි

ආදර දුවේ පුතේ ඔයාල ගොඩක් හොඳ දරුවොනේ.

එනිසා මම ඔයාලව චාරිකාවක් එක්ක යන්නයි හදන්නේ.කෝ බලන්න මාත් එක්ක යන්න කැමති අය.

ආ.....ඔයාල හැමෝම කැමතියි නේද? එහෙනම් මගෙ පුතේ අපි යන්නෙ විහාර ගෙයක් නරඹන්න.ඉතින් යන්න කලින් අපි යන්නෙ කවදාද?කොයි පන්සලටද යන්නෙ.අපි මොනවද අරන් යන්න ඕන.කොහොමද අපි යන්න ඕන. වන්දනාවට පෙර අපි මොනාද කරන්නේ.විහාර ගෙයි අපි මොනවද නරඹනනේ.අපි හැසිරෙන්න ඕනි කොහොමද? යනාදී ප්‍රශ්න වලට පිළිතුරු සොයා ගන්න ඕනි දුවේ පුතේ.

ඉතින් අපි වගේම පහේ පන්තියේ යාළුවෝ පිරිසක් විහාර ගෙයක් නරඹන්න ගිය ආකාරය අපේ බුද්ධ ධර්මය පොතේ 13වන පාඩමේ සඳහන් වෙනවා.අපි ඒ පාඩම හොඳින් කියවල ඒ තොරතුරු සොයා බලමු නේද?

හොඳයි මගෙ දුවේ පුතේ ඒ පාඩම ඇසුරින් මගේ මේ පුශ්න වලට පිළිතුරු දෙන්න පුළුවන් නේද?

1) විහාරස්ථානය වෙත යන විට රැගෙන යාමට සූදානම් කර ගන්නේ මොනවාද?
2) විහාර භූමියට ඇතුළු වූයේ කෙසේද?
3) වන්දනාවට පෙර ඔවුන් කළේ කුමක්ද
4) බුදුරජාණන් වහන්සේගේ දෙපැත්තේ වැඩ සිටින්නේ කවුද?
5) නිල් පාටින් හා කහ පාටින් අඹා ඇත්තේ කවුරුන්ද?

මෙම පාඩම තුළින් ඔබ ඉගෙන ගත් දෑ ඔබේ ජීවිතයට එකතු කර ගන්න.

බුද්ධ ධර්මය විෂයට අදාළ වීඩියෝ enanapiyasa වෙබ් අඩවියේ සුහුරු පාඩම් යටතේ ලබාගත හැකිය